සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2022 ජූලි

## (101) මූල්‍ය ගිණුම්කරණය

(Financial Accounting)

2022-08-27
පෙරවරු
[09.00 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර* ***පමණක්*** *භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(7) *ලකුණු 100 යි.*

---

## <u>A කොටස</u>

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාළ අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් ඒවා අතුරෙන්, මූල්‍ය තොරතුරුවල ගුණාත්මක ලක්ෂණයක් වන්නේ කුමක් ද?

(1) අඛණ්ඩ පැවැත්ම.
(2) අදාළ බව.
(3) උපචිත පදනම.
(4) ඓතිහාසික පිරිවැය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, මූලික සටහන් පොතක් **නොවන්නේ** කුමක් ද?

(1) මුදල් පොත.
(2) දෛනික ගැනුම් පොත.
(3) පොදු ලෙජරය.
(4) දෛනික විකුණුම් පොත.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, නිවැරදි මූල්‍ය ගිණුම්කරණ ක්‍රියාවලිය තෝරන්න:

(1) යෙදවුම් ⟶ නිමැවුම් ⟶ ක්‍රියාවලිය.
(2) නිමැවුම් ⟶ ක්‍රියාවලිය ⟶ යෙදවුම්.
(3) යෙදවුම් ⟶ ක්‍රියාවලිය ⟶ නිමැවුම්.
(4) නිමැවුම් ⟶ යෙදවුම් ⟶ ක්‍රියාවලිය.

1.4 **සීමාසහිත XYZ සමාගමේ** 2022 මාර්තු 31 දිනට මුදල් පොතේ හර ශේෂය රු.225,000/- ක් වූ අතර, එදිනට ඇති බැංකු ප්‍රකාශනයේ ශේෂයෙන් එය වෙනස් විය. 2022 මාර්තු 31 දිනට ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් රු.36,000/- ක් වූ අතර, බැංකුව විසින් අයකරන ලද රු.5,000/- ක බැංකු ගාස්තු මුදල් පොතේ සැලකිල්ලට ගෙන නොතිබුණි.

2022 මාර්තු 31 දිනට බැංකු ප්‍රකාශනයේ පෙන්නුම් කළ ශේෂය වූයේ:

(1) රු.256,000/-. (2) රු.184,000/-. (3) රු.194,000/-. (4) රු.266,000/-.

1.5 **රන්සි ට්‍රේඩර්ස්** සිය ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා බැංකු ණයක් ලබා ගත්තේය. මෙම ගනුදෙනුව වාර්තා කරන නිවැරදි ද්විත්ව සටහන වන්නේ:

(1) බැංකු ණය ගිණුම හර සහ මුදල් ගිණුම බැර.

(2) බැංකු ණය ගිණුම හර කිරීම සහ ප්‍රාග්ධන ගිණුම බැර.

(3) මුදල් ගිණුම හර සහ බැංකු ණය ගිණුම බැර.

(4) මුදල් ගිණුම හර සහ ප්‍රාග්ධන ගිණුම බැර.

1.6 **රන්මිර,** අමතර ප්‍රාග්ධනය වශයෙන් මුදලින් රු.1,000,000/- ක් ඔහුගේ කේවලස්වාමි ව්‍යාපාරයේ ආයෝජනය කළේය.

පහත සඳහන් ඒවා අතුරෙන්, ඉහත ගනුදෙනුව නිසා ගිණුම්කරණ සමීකරණයට සිදුවූ නිවැරදි බලපෑම තෝරන්න:

| | **වත්කම් (රු.)** | **=** | **ප්‍රාග්ධනය (ස්කන්ධය) (රු.)** | **+ වගකීම (රු.)** |
|---|---|---|---|---|
| (1) | + 1,000,000 | = | | + 1,000,000 |
| (2) | + 1,000,000 | = | + 1,000,000 | |
| (3) | - 1,000,000 | = | - 1,000,000 | |
| (4) | - 1,000,000 | = | | - 1,000,000 |

1.7 ගැනුම්කරුවෙකු විසින් ණයට ගත් භාණ්ඩ ආපසු හරවා එවීමේදී විකුණුම්කරු විසින් භාවිත කරනු ලබන නිවැරදි මූලාශ්‍ර ලියවිල්ල තෝරන්න:

(1) ගැණුම් ඇණවුම. (2) ජර්නල් වවුචරය.

(3) හර පත. (4) බැර පත.

**1.8** 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකලස්වාමි ව්‍යාපාරයක් වන **රෝස් ට්‍රේඩර්ස්හි** පොත්වලින් පහත සඳහන් තොරතුරු, උපුටාගෙන තිබේ:

| | **රු.** |
|---|---:|
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 2,000,000 |
| වර්ෂය තුළදී අයිතිකරු විසින් සිදුකළ ගැනිලි | 300,000 |
| 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ලාභය | 480,000 |
| 2022 මාර්තු 31 දිනට වගකීම් | 600,000 |

ඉහත සඳහන් තොරතුරු අනුව, 2022 මාර්තු 31 දිනට මුළු වත්කම් වන්නේ:

(1) රු.2,180,000/-. (2) රු.2,600,000/-. (3) රු.2,780,000/-. (4) රු.3,380,000/-.

**1.9** පහත සඳහන් ගනුදෙනු අතුරෙන්, වත්කම් අඩුවීමට බලපාන ගනුදෙනුව වන්නේ කුමක් ද?

(1) මුදලින් රු.200,000/- ක් ගෙවා කාර්යාලයේ පාවිච්චිය සඳහා පරිගණකයක් මිලදී ගැනීම.

(2) ව්‍යාපාරයේ අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු.65,000/- ක් පිරිවැය වූ භාණ්ඩ ගැනීම.

(3) ණයගැතියෙකුගෙන් රු.100,000/- ක මුදලක් එකතු කර ගැනීම.

(4) රු.250,000/- ක් පිරිවැය වූ තොගයක්, රු.400,000/- කට ණයට විකිණීම.

**1.10** "අස්තිත්වයක් අපේක්ෂා කළ හැකි අනාගත කාලයක් දක්වා මෙහෙයුම් නොකඩවා කරගෙන යන බව උපකල්පනය මත පිහිටා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි."

ඉහත ප්‍රකාශනයට අදාළ වන ගිණුම්කරණ සංකල්පය වන්නේ:

(1) අඛණ්ඩ පැවැත්ම සංකල්පයයි. (2) උපචිත සංකල්පයයි.

(3) අස්තිත්ව සංකල්පයයි. (4) කාලච්ඡේද සංකල්පයයි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.11** කාර්යාලයේ භාවිත කිරීම සඳහා කාර්යාල උපකරණයක් ණයට මිලදී ගැනීම, පොදු ජර්නලයේ සටහන් කරනු ලබයි.

**1.12** ව්‍යාපාරයක සියලුම ගනුදෙනු සහ සිදුවීම් මුදලින් මැනිය හැකි වුවද, නොහැකි වුවද වාර්තා කිරීම අවශ්‍ය වේ.

**1.13** පොදු ලෙජරය, මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සංරචකයකි.

**1.14** පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය [Net Realizable Value (NRV)] යන දෙකෙන් අඩු අගයට තොග අගය කිරීම, ආරක්ෂණ ගිණුම්කරණ සංකල්පය සඳහා නිදසුනකි.

**1.15** ස්කන්ධය, ආදායම් ප්‍රකාශනයට සෘජුවම සම්බන්ධ මූලිකාංගයක් වේ.

*අංක **1.16** සිට **1.20** දක්වා ඇති ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.16** ව්‍යාපාර අස්තිත්වයක භාවිත කරනු ලබන මූලාශ්‍ර ලියවිලි වර්ග දෙකක්(02) සඳහන් කරන්න.

**1.17** ව්‍යාපාර ආචාරධර්ම (business ethics) වැදගත් වන්නේ ඇයිදැයි යන්නට හේතු දෙකක්(02) ලැයිස්තුගත කරන්න.

**1.18** "වියදමක්" යන පදය නිර්වචනය කරන්න.

**1.19** පොදු ගිණුම්කරණ මෘදුකාංග සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

**1.20** **මහේලි ස්ටෝර්ස්,** 2020 අප්‍රේල් 01 දින රු.800,000/- කට යන්ත්‍රයක් අත්පත් කර ගත්තේය. ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ හීනවන ශේෂ ක්‍රමය භාවිතයෙන් වාර්ෂිකව 20% ක අනුපාතයකට යන්ත්‍ර ක්ෂය කිරීමයි.

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ක්ෂය අයකිරීම ගණනය කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

(A) ඒකලස්වාමි ව්‍යාපාරයක ගනුදෙනු පහක් (5) මගින් ගිණුම්කරණ සමීකරණයට සිදුවන බලපෑම ඔබ වෙත පහත දී තිබේ:

| | වත්කම් | | | | | | | = | ස්කන්ධය (ප්‍රාග්ධනය) | + | වගකීම් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | **කාර්යාල උපකරණ** | + | **තොග** | + | **වෙළෙඳ ණයගැතියෝ** | + | **මුදල්** | | | | **වෙළෙඳ ණයහිමියෝ** |
| (1) | | | | | | | +1,200,000 | = | +1,200,000 | | |
| (2) | | | +150,000 | | | | (150,000) | = | | | |
| (3) | | | | | | | (40,000) | = | (40,000) | | |
| (4) | | | (65,000) | | +80,000 | | | = | +15,000 | | |
| (5) | +100,000 | | | | | | | = | | | +100,000 |

**ඔබ විසින් කළ යුතු දෑ:**

ඉහත ගිණුම්කරණ සමීකරණයේ (1) සිට (5) දක්වා ඇති එක් එක් අයිතමය සඳහා සිදුවිය හැකි ගනුදෙනුව **හඳුනා දක්වන්න.**

(ලකුණු 05)

(B) **කවිඳු ස්ටෝර්ස්හි** බැංකු ප්‍රකාශනයේ 2022 මාර්තු 31 දිනට රු.390,000/- ක වාසිදායක ශේෂයක් පෙන්වූ අතර, මුදල් පාලන ගිණුමේ රු.560,000/- ක හර (වාසිදායක) ශේෂයක් පෙන්වීය. වෙනස සඳහා හේතු වශයෙන් පහත සඳහන් කරුණු හඳුනාගන්නා ලදී:

(1) බැංකුවෙන් ලබාගත් ණයක් සඳහා රු.120,000/- ක ණය වාරිකයක් බැංකුව විසින් අයකරගෙන තිබූ අතර, එය මුදල් පොතේ වාර්තා කර නොමැත.

(2) බැංකුව විසින් පෙර මාසයේදී වැඩියෙන් අයකළ බැංකු ගාස්තු නිවැරදි කිරීම සඳහා බැංකුව විසින් රු.5,000/- ක් ආපසු ලබාදී (බැර කර) තිබේ. මෙය මුදල් පොතේ වාර්තාකර නොමැත.

(3) බැංකුවේ තැන්පත් කරන ලද රු.180,000/- ක චෙක්පතක් 2022 මාර්තු 31 දින වන විට උපලබ්ධි වී නොමැත.

(4) 2022 මාර්තු 30 දින **කවිඳු** විසින් රු.125,000/- ක චෙක්පතක් නිකුත් කරන ලද අතර, එය 2022 මාර්තු 31 දින වන විටත් ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් කර නොමැත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) ගළපන ලද මුදල් පාලන ගිණුම (මුදල් පොත). (ලකුණු 03)

(b) 2022 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශනය. (ලකුණු 02)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**ලස්සන පොට්ස්,** මල් පෝච්චි නිෂ්පාදකයෙකු වන අතර, පහත සඳහන් තොරතුරු 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **ලස්සන පොට්ස්** හි පොත්වලින් උපුටාගන්නා ලදී:

| විස්තරය | රු. |
|---|---:|
| අමුද්‍රව්‍ය මිලට ගැනුම් | 3,800,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | 350,000 |
| කම්හල් කළමනාකරුගේ වැටුප් | 420,000 |
| සෘජු වේතන - නිෂ්පාදන කම්කරුවන් | 700,000 |
| විදුලිය | 620,000 |
| ජලය | 400,000 |
| කම්හලේ රක්ෂණය | 125,000 |
| ක්ෂය - පිරියත සහ යන්ත්‍ර | 250,000 |
| ක්ෂය - මෝටර් ලොරිය | 120,000 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) තොග පහත පරිදි අගය කර තිබේ: *(රු.)*

| විස්තරය | 2021 අප්‍රේල් 01 දිනට | 2022 මාර්තු 31 දිනට |
|---|---:|---:|
| අමුද්‍රව්‍ය (පිරිවැයට) | 800,000 | 850,000 |
| නොනිමි වැඩ (ප්‍රාථමික පිරිවැයට අගය කළ) | 235,000 | නොමැත |

(2) පහත දැක්වෙන වියදම්, පහත සඳහන් පරිදි බෙදා වෙන්කළ යුතුය:

| වියදම | කම්හල | කාර්යාලය |
|---|---|---|
| විදුලිය | 80% | 20% |
| ජලය | 90% | 10% |

(3) මෝටර් ලොරිය භාවිත කරනු ලබන්නේ අමු ද්‍රව්‍ය කම්හලට බෙදාහැරීම සඳහා පමණි.

(4) නිෂ්පාදනය කරනු ලබන සෑම පෝච්චියකටම සෘජු වේතන හැරුණුකොට රු.25/- බැගින් වූ දිරි දීමනාවක් සඳහා කම්හල් කම්කරුවන් හිමිකම් ලබයි. වර්ෂය තුළදී නිෂ්පාදනය කරන ලද මුළු පෝච්චි ගණන 10,000 ක් විය.

(5) නිෂ්පාදනය කරනු ලබන පෝච්චි, නිෂ්පාදන පිරිවැය මත 20% ක ලාභ ආන්තිකයක් සහිතව වෙළෙඳ අංශයට මාරු කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **ලස්සන පොට්ස් හි** නිෂ්පාදන පිරිවැය ලේඛණය (නිෂ්පාදන ගිණුම) **පිළියෙල කරන්න.** (ලකුණු 10)

## **04** වන ප්‍රශ්නය

**දුස්රා ට්‍රේඩර්ස්, මුරලි** විසින් 2021 අප්‍රේල් 01 දින මුදලින් රු.7,000,000/- ක් ආරම්භක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරමින් ආරම්භ කළ කේවලස්වාමි ව්‍යාපාරයකි.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් පාලන ගිණුම (මුදල් පොත) පහත පරිදි විය:

**මුදල් පාලන ගිණුම (මුදල් පොත)**

| | හර (රු.) | | බැර (රු.) |
|---|---|---|---|
| මූලික ප්‍රාග්ධන ආයෝජනය | 7,000,000 | වෙළෙඳ ණයහිමියන්ට කළ ගෙවීම් | 1,800,000 |
| අත්පිට විකුණුම් | 3,200,000 | අත්පිට ගැනුම් | 1,200,000 |
| වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබීම් | 2,400,000 | විදුලිය සහ ජලය | 300,000 |
| | | කාර්යාල කුලිය | 275,000 |
| | | යන්ත්‍රයක් මිලදී ගැනීම (2021 ඔක්තෝම්බර් 01 දින මිලට ගන්නා ලදි) | 2,500,000 |
| | | වැටුප් සහ වේතන | 2,100,000 |
| | | ශේෂය ප/ගෙ | 4,425,000 |
| | **12,600,000** | | **12,600,000** |
| ශේෂය ඉ/ගෙ | 4,425,000 | | |

(2) 2022 මාර්තු 31 දිනට ගිණුම් පොත්වල පහත සඳහන් ශේෂයන් පෙන්නුම් කෙරේ:

| | රු. |
|---|---|
| වෙළෙඳ ණයගැතියෝ | 950,000 |
| වෙළෙඳ ණයහිමියෝ | 940,000 |
| ගෙවිය යුතු විදුලි සහ ජල බිල්පත් | 29,000 |

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ සරල මාර්ග ක්‍රමයට පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් යන්ත්‍ර සඳහා ක්ෂය ප්‍රතිපාදනය කිරීමයි.

(4) 2022 මාර්තු 31 දිනට තොග කිසිවක් නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2022 මාර්තු 31 දිනට, **දුස්රා ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**අසාර් ට්‍රේඩර්ස්,** පිටකොටුවේ පිහිටි තිර රෙදි විකිණීමේ නිරත ව්‍යාපාරයකි. ගිණුම් විධායකයෙකු විසින් පිළියෙල කරන ලද **අසාර් ට්‍රේඩර්ස්** හි 2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම එකඟ නොවීය. කෙසේවෙතත්, රු.45,000/- ක් වූ වෙනස අවිනිශ්චිත ගිණුමකට බැර කර කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන ලදී. **අසාර් ට්‍රේඩර්ස්,** වෙළෙඳ ලැබිය යුතු මුදල් සහ වෙළෙඳ ගෙවිය යුතු මුදල් සඳහා පාලන ගිණුම් පවත්වාගෙන යයි.

පහත සඳහන් වැරදි පසුව හඳුනා ගන්නා ලදී:

(1) ගමන් වියදම් සඳහා ගෙවන ලද රු.9,000/- ක මුදලක්, වැටුප් හා වේතන ගිණුමට හර කර තිබුණි. මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(2) රු.129,000/- ක් වටිනා අත්පිට විකුණුම් ඉන්වොයිසියක් නිවැරදිව මුදල් පොතේ වාර්තා කර තිබුණි. නමුත් එය විකුණුම් ගිණුමේ සටහන් කර නොතිබුණි.

(3) රු.56,000/- ක රක්ෂණ වාරික ගෙවීම, මුදල් පොතේ පමණක් සටහන් කර තිබුණි.

(4) විකුණුම් ආපසු එවුම් දෛනික පොතේ එකතුව රු.8,000/- ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(5) බැංකුව විසින් බැංකු අයිරා පොලිය ලෙස අයකර තිබූ රු.21,500/- ක්, පොලී ආදායම් ගිණුමට බැර කර තිබුණි. නමුත් මෙය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(6) මිලට ගත් පරිගණකයක පිරිවැය වූ රු.120,000/- ක්, පරිගණක නඩත්තු ගිණුමට හර කර තිබූ අතර, එය මුදල් පොතේ නිවැරදිව වාර්තා කර තිබුණි.

(7) රු.15,000/- ක දුරකතන වියදම්, දුරකතන වියදම් ගිණුමට දෙවරක් හර කර තිබූ අතර, එයට අදාල බැර සටහන නිවැරදිව වාර්තා කර තිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ඉහත සඳහන් වැරදි නිවැරදි කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (ලකුණු 07)

(b) අවිනිශ්චිත ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය

**තිමිර ට්‍රේඩර්ස්, තිමිරට** හිමි තෝවලස්වාමි ව්‍යාපාරයකි. 2022 මාර්තු 31 දිනට **තිමිර ට්‍රේඩර්ස්** හි ශේෂ පිරික්සුම පහත දැක්වේ:

**තිමිර ට්‍රේඩර්ස්**

**2022 මාර්තු 31 දිනට ශේෂ පිරික්සුම** *(රු.'000)*

| විස්තරය | හර | බැර |
|---|---|---|
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| යන්ත්‍ර | 2,000 | |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 800 | |
| 2021 අප්‍රේල් 01 දිනට සමුච්චිත ක්ෂය: | | |
| යන්ත්‍ර | | 400 |
| ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | | 320 |
| විකුණුම් | | 202,000 |
| ගැනුම් | 124,000 | |
| දුන් වට්ටම් | 4,000 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 20,200 | |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | | 3,000 |
| අතැති මුදල් | 95 | |
| බැංකු අයිරාව | | 1,050 |
| 2021 අප්‍රේල් 01 දිනට තොගය | 13,950 | |
| විදුලිය | 3,250 | |
| වැටුප් සහ වේතන | 42,000 | |
| බැංකු අයිරාව මත පොලිය | 500 | |
| බැංකු ණය පොලිය | 1,100 | |
| ප්‍රවාහන සහ ගමන් වියදම් | 7,200 | |
| කාර්යාල කුලිය | 2,800 | |
| 2021 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධන ගිණුම | | 7,625 |
| බැංකු ණය | | 7,500 |
| **එකතුව** | **221,895** | **221,895** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2022 මාර්තු 31 දිනට අවසාන තොගය රු.8,250,000/- ක පිරිවැයකට අගය කරන ලදී.

(2) 2021 අප්‍රේල් 01 දින, **තිමිරට** අයත්ව තිබූ ලොරි රථයක්, ව්‍යාපාරයට මාරු කරන ලද අතර, 2021 අප්‍රේල් 01 දින ලොරි රථයේ වටිනාකම රු.1,000,000/- ක් විය. නමුත් මෙය ගිණුම් පොත්වල වාර්තා කර නොමැත.

(3) ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වන්නේ, පහත සඳහන් පරිදි පිරිවැය මත සරල මාර්ග ක්‍රමයට ක්ෂය සඳහා ප්‍රතිපාදනය කිරීමයි:

| | | |
|---|---|---|
| යන්ත්‍ර | : | වර්ෂයකට 10% බැගින් |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | : | වර්ෂයකට 20% බැගින් |
| මෝටර් වාහන | : | වර්ෂයකට 25% බැගින් |

(4) 2021 අප්‍රේල් 01 දින, **තිමිර ට්‍රේඩර්ස්** කාර්යාල පරිශ්‍රය සඳහා නව කුලී ගිවිසුමකට එළඹුණේය. නව කුලී ගිවිසුම අනුව මාසික කුලිය රු.200,000/- ක් වන අතර, 2022 අප්‍රේල් සහ මැයි මාස සඳහා වන කුලිය ද වර්ෂය තුළදී ගෙවන ලදී.

(5) 2022 මාර්තු මාසය සඳහා විදුලි බිල වූ රු.85,000/- ක මුදල, 2022 මාර්තු 31 දින වන විට ගෙවා තිබුණේ නැත.

(6) **සීමාසහිත ABC (පෞද්ගලික) සමාගමෙන්** ලැබිය යුතු රු.200,000/- ක් බොල්ණය ලෙස කපා හැරීමට **තිමිර** තීරණය කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 11)

(b) 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 09)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අන්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |